පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

දෙවන වාර පරීක්ෂණය - 2025

ශ්‍රේණිය
13

විෂයය :- ආර්ථික විද්‍යාව I

පාසලේ නම : .....

ඇතුළත්වීමේ අංකය : .....

කාලය : 02

සැලකිය යුතුයි :


- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ පසුපස දක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා

01. ආර්ථිකයක, නිෂ්පාදන කාර්යක්ෂමතාවය යටතේ එක් භාණ්ඩයකින් නිමැවුම වැඩි කරන විට ආවස්ථික පිරිවැය ක්‍රමයෙන් වැඩි වේ නම් එරටේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය,
(1) මූලයට අවතල වේ.
(2) මූලයට උත්තල වේ.
(3) සරළ රේඛීය වේ.
(4) පූර්ණ නම්‍ය වේ.
(5) සෘජුකෝණාස්‍රාකාර බහුවලයක හැඩයක් වේ.

02. ආර්ථික නොවන සම්පත් ආර්ථික සම්පත් වලින් වෙනස් වන්නේ ආර්ථික නොවන සම්පත්වල,
(1) ආවස්ථික පිරිවැයක් ඇතිවන නිසාය.
(2) අසීමිත සැපයුමක් පවතින නිසාය.
(3) සීමිත සැපයුමක් පවතින නිසාය.
(4) උපයෝගීතාවයක් ඇති නිසාය.
(5) නිෂ්පාදන ක්‍රියාවලියට යොදාගත හැකි නිසාය.


03. වෙළෙඳපොල ආර්ථිකයක මිල යන්ත්‍රණයේ කාර්යයක් ලෙස හඳුනා ගත හැක්කේ කුමක් ද?
(1) තරගකාරීත්වය පාලනය
(2) දේපොළ අයිතිය සුරක්ෂිත කිරීම
(3) මිල පාලනයන් ඇති කිරීම
(4) සාධාරණ අන්දමට සම්පත් බෙදාහැරීම තහවුරු කිරීම
(5) හිඟ සම්පත් සලාකනය කිරීම

04. රූප සටහනට අනුව ආර්ථිකය වර්ථමානයේ දී A නිමැවුම් ලක්ෂයේ නිෂ්පාදනයේ නිරත වීමේ දී, Y භාණ්ඩ 50 හා X භාණ්ඩ 100 ක් නිපදවයි නම් හා B ලක්ෂයේ දී X භාණ්ඩ 150 ක් නිපදවයි නම් Y භාණ්ඩ නිමැවුම වැඩි කිරීමේ ආන්තික ආවස්ථික පිරිවැය X භාණ්ඩ වලින් කොපමණ ද?



(1) 2 ක් වේ.
(2) 1 ක් වේ.
(3) 3 ක් වේ.
(4) 4 ක් වේ.
(5) 5 ක් වේ.

05. ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පහතින් දක්වේ. ආර්ථිකයක ආර්ථික පසු බැසීමක් නිරූපනය වන්නේ කෙසේ ද?



(1) B සිට A දක්වා
(2) C සිට B දක්වා
(3) D සිට B දක්වා
(4) B සිට C දක්වා
(5) A සිට D දක්වා

06. පහත දැක්වෙන දෑ අතුරින් සැපයුම් නීතිය ක්‍රියාත්මක වීමේ දී වෙනස් වන සාධකයක් ලෙස උපකල්පනය කරණු ලබන සාධකයක් වන්නේ කවරක් ද?

(1) සම්බන්ධිත භාණ්ඩ මිල (2) තාක්ෂණය (3) භාණ්ඩයක මිල
(4) යෙදවුම් මිල (5) රජයේ බදු අයකිරීම


07. භාණ්ඩ වර්ග තුනක හරස් ඉල්ලුම් නම්‍යතා අගයන් කිහිපයක් පහත දැක්වේ.

භාන්ඩය	හරස් ඉල්ලුම් නම්‍යතාවය
X	0.8
Y	0.2
Z	- 3

ඉහත භාණ්ඩ අතරින් අදේශන භාණ්ඩ ලෙස හඳුනාගත හැක්කේ කුමන භාණ්ඩ ද?

(1) Y හා X. (2) Y පමණි (3) X පමණි
(4) Z පමණි (5) Y හා Z.

08. රූප සටහනේ දක්වා ඇති සැපයුම් වක්‍රයට අදාල සැපයුම් සමීකරණයත්, මිල වැඩි වන විට සැපයුම් නම්‍යතාවයේ හැසිරීමත්, නිවරදිව ප්‍රකාශ වන්නේ පහත කුමකින් ද?




	සැපයුම් සමීකරණය	නම්‍යතාවයේ හැසිරීම
(1)	Qs = - 100 + 2p	අඩු වේ.
(2)	Qs = 100 + 2p	අඩු වේ.
(3)	Qs = 2p	වැඩි වේ.
(4)	Qs = 200 + 2p	වැඩි වේ.
(5)	Qs = - 80 + 2p .	වැඩි වේ.

09. x භාණ්ඩයේ මිල අඩු වීම නිසා ඇතිවූ ආදායම් ප්‍රතිවිපාකය යටතේ ඉල්ලුම් ප්‍රමාණය අඩු වූ අතර සමස්ත මිල ප්‍රතිවිපාකට අනුව ඉල්ලුම් ප්‍රමාණය පහළ ගියේ නම්, අදාල භාණ්ඩය,

(1) ගිෆන් භාණ්ඩයකි. (2) බාල භාණ්ඩයකි. (3) සාමාන්‍ය භාණ්ඩයකි.
(4) ආදේශන භාණ්ඩයකි. (5) අනුපූරක භාණ්ඩයකි.

10. රූප සටහනට අනුව භාණ්ඩයක සමතුලිතය නිරූපනය වන අතර මෙම අවස්ථාවේ දී සැපයුමේ වැඩි වීමක් සහ ඉල්ලුමේ අඩු වීමක් සිදු වුවහොත් පහත කුමක් නිශ්චිතවම සිදු වේ ද?



(1) සමතුලිත මිල වැඩි වේ.
(2) සමතුලිත මිල අඩු වේ.
(3) සමතුලිත ප්‍රමාණය වැඩි වේ.
(4) සමතුලිත මිල වෙනස් වීම අවිනිශ්චිත වේ.
(5) සමතුලිත ප්‍රමාණය අඩු වේ.


11. කිසියම් භාණ්ඩයක මිල රුපියල් 150 දී ඉල්ලුම් ප්‍රමාණය මිලියන 10 කි. එම භාණ්ඩයේ මිල රුපියල් 50 කින් අඩු කළ විට, භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය 5 කින් වැඩි විය. භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය කොපමණ ද?

(1) -2 (2) -3 (3) -5
(4) -4 (5) -1

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


Past Papers Wiki

12. භාණ්ඩයක් සඳහා නිෂ්පාදන සහනාධාරයක් ලබාදුන් පසු වෙළෙඳපොල සමතුලිතය වෙනස් වී ඇති ආකාරය පහත රූප සටහනේ දැක්වේ.සහනාධාරයෙන් පසු නිෂ්පාදන අතිරික්තය හා රජයේ වියදම කොපමණ වේ ද?



	නිෂ්පාදන අතිරික්තය	රජයේ වියදම
(1)	A + B	C + F
(2)	F + C + B + G	C + D + E
(3)	A + B + C	C + F + B + G
(4)	A + B + C + D + E	B + G
(5)	F + C + B + G	B + C + D + E +H + G

13. වෙළෙඳපොලේ පවතින භාණ්ඩයක් සඳහා නිෂ්පාදන ඒකක සහනාධාරයක් ලබා දුන් පසු වෙළෙඳපොල සමතුලිතය වෙනස් වී ඇති ආකාරය පහත රූප සටහනේ නිරූපණය වේ. සහනාධාරය සඳහා රජයේ වියදම කොපමණ ද?



(1) රු. 18000 කි.
(2) රු. 16000 කි.
(3) රු. 42 000 කි.
(4) රු. 2 0000 කි.
(5) රු. 3 6000 කි.

14. සාමාන්‍ය භාණ්ඩයක් සඳහා රජයක් අයකල නිෂ්පාදන එකක බද්ද ඉවත් කල අතර එම කාල පරිච්ඡේදය තුල ගැනුම්කරුවන්ගේ ආදායම ද වැඩි වීම යන දෙකම එකවර සිදු විය. එනිසා භාණ්ඩයේ සමතුලිත මිලට හා ප්‍රමාණයට කුමක් සිදු වේ ද?

සමතුලිත මිල	සමතුලිත ප්‍රමාණය
(1) වැඩි වේ	වැඩි වේ
(2) අඩු වේ	අවිනිශ්චිත වේ
(3) අඩු වේ	වැඩි වේ
(4) අවිනිශ්චිත වේ	වැඩි වේ
(5) වැඩි වේ	අවිනිශ්චිත වේ

15. කිසියම් භාණ්ඩයක සැපයුම් සමීකරණය Qs = - 500 + 20p මගින් දැක්වේ, භාණ්ඩය සඳහා රුපියල් 75 ක සළුල අවම මිලක් නියමකල බව සලකන්න එම මිල යටතේ මුලු සැපයුම් ප්‍රමාණය වෙළෙඳපොළට සැපයීමට නිෂ්පාදකයන් තීරණය කල හොත් නිෂ්පාදනයේ විචල්‍ය පිරිවැය කොපමණ ද?

(1) මිල 50000 කි. (2) මිල 75000 කි. (3) මිල 25000 කි.
(4) මිල 1000 කි. (5) මිල 5000 කි.

16. පාරිභෝගිකයාට වැඩි බදු ප්‍රමාණයක් දැරීමට සිදු වන්නේ පහත කුමන නම්‍යතාවයන් යටතේ ද?

ඉල්ලුමේ මිල නම්‍යතාව	සැපයුම් මිල නම්‍යතාව
(1) - 2	2
(2) - 1	1
(3) - 0.4	2
(4) - 2	0.5
(5) - 5	0.6

17. හීන වන ඵල නීතියට අනුව ආන්තික ඵලදායීතාවය අඩු වන විට පිරිවැයට කුමක් සිදුවේ ද?

(1) කෙටි කාලීන ස්ථාවර පිරිවැය වැඩි වේ
(2) කෙටි කාලීන විචල්‍ය පිරිවැය අඩු වේ
(3) කෙටි කාලීන ආන්තික පිරිවැය වැඩි වේ
(4) දිගු කාලීන සාමාන්‍ය පිරිවැය අඩු වේ
(5) දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වැඩි වේ

18. විචල්‍යය යෙදවුමේ ආන්තික ඵලදාව, ශූන්‍ය විට වන විට,

(1) මුළු ඵලදාව උපරිම වේ.
(2) සාමාන්‍ය මුළු පිරිවැය වැඩි වේ.
(3) ආන්තික පිරිවැය අවම වේ.
(4) ආන්තික පිරිවැය වැඩිවේ වේ.
(5) ස්ථාවර පිරිවැය අඩු වේ.

19. කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ දී සාමන්‍ය විචල්‍ය පිරිවැය වැඩි වන විට පහත කුමක් අඩුවේ ද?


(1) ආන්තික පිරිවැය. 2) සාමාන්‍ය මුලු පිරිවැය. (3) මුලු පිරිවැය.
(4) මුලු විචල්‍යය පිරිවැය. (5) සාමාන්‍ය ස්ථාවර පිරිවැය

20. කතිපයාධිකාරී ආයතනයකට අදාල ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(1) ආයතන සංඛ්‍යාව අසීමිත වීම (2) නිදහස් ප්‍රවේශයක් පැවතීම (3) මිල ගණුවකු වීම
(4) තොරතුරු පූර්ණව පැවතීම (5) ආයතන සංඛ්‍යාව සීමිත වීම


21. පූර්ණ තරඟකාරී ආයතනයක් රු. 120ක පැවරුණු මිලක් යටතේ ක්‍රියාත්මක වන අතර නිමැවුම 380 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය රුපියල් 40ක් නම් ආයතනය.

(1) ආර්ථික ලාභ උපයයි
(2) ප්‍රාමාණික ලාභ උපයයි.
(3) ආයතනය වසා දැමිය යුතුයි.
(4) ලාභ උපරිම නිමැවුම් මට්ටමේ දී ආර්ථික අලාභ ලබයි.
(5) ආන්තික ලාභ උපරිම වන නිසා ආර්ථික ලාභ උපරිම කර ගනී.



22. තරඟකාරී ආයතනයක් රූප සටහනේ දැක් වේ එම ආයතනය භාණ්ඩ 1000 සිට 1400 ක් නිපදවන විට අමතර ඒකකයක් නිපද වීමෙන්,

(1) ලාභ හිමිකර ගනී.
(2) ලාභ උපරිම කර ගනී.
(3) ආන්තික පිරිවැය භාණ්ඩයේ මිලට සමාන කර ගනී.
(4) අලාභ වැඩිකර ගනී
(5) සාමාන්‍ය විචල්‍ය පිරිවැය අඩුකර ගනී.



23. පුද්ගලයකු තම ගෙවත්ත පිරිසුදු කර ගැනීම සඳහා ශ්‍රමිකයකු තෝරා ගන්නා අතර එම ශ්‍රමිකයා දිනකට රුපියල් 2500ක වැටුපක් අවම වශයෙන් අපේක්ෂා කරන අතර දින තුනක් අවසානයේදී වැටුප් වශයෙන් රුපියල් 7500 ක් ගෙවා තිබුනි නම් එම කාර්යය අවසානයේ දී එම ශ්‍රමිකයාගේ ආර්ථික බදු කුලිය,

(1) රුපියල් 7500 කි
(2) රුපියල් 2500 කි
(3) රුපියල් 5000 කි
(4) ආර්ථික බදු කුලියක් නැත
(5) සංක්‍රාම ඉපයීමට සමාන වේ

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

24. කෙටි කාලයේ දී පූර්ණ තරඟ ආයතනයක් අලාභ ලබන විට වසා දැමීමට තීරණය කර ඇති බව සලකන්න එහිදී දී ව්‍යාපාරයේ අයිතිකරුට තීරණ ගැනීමට ආදාල වන්නේ පහත කුමක් ද?

(1) අවම සාමාන්‍ය මුළු පිරිවැය
(2) අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැය
(3) අවම සාමාන්‍ය ආන්තික පිරිවැය
(4) සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා සාමාන්‍ය මුළු පිරිවැය
(5) සාමාන්‍ය ස්ථාවර පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය

25. දළ දේශීය නිෂ්පාදිතය ඇතුලත් ආර්ථික ගණුදෙනුවක් වන්නේ පහත කුමක්ද?

(1) විදේශ ප්‍රාථමික ආදායම් ලැබීම්
(2) විදේශ සේවා නියුක්ති ප්‍රේෂණ ලැබීම
(3) රජයේ විශ්‍රාම වැටුප් ගෙවීම
(4) නව මෝටර් රථ මිලදී ගැනීම්
(5) රජය අස්වැසුම සහනාධාර ගෙවීම්

26. කිසියම් කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම්කරණයට අදාළ දත්ත කිහිපයක් පහත දැක්වේ. සංඛ්‍යා රුපියල් බිලියන වලිනි.

කෘෂි කර්මාන්තයේ දළ එකතු කල වටිනාකම	700
කාර්මික අංශයේ දළ එකතු කල වටිනාකම	300
සේවා අංශයේ දළ නිමැවුමේ වටිනාකම	950
දළ දේශීය වියදම	1500
භාණ්ඩ හා සේවා මත බදු අඩු කල සහනාධාර	40
සේවා අංශයේ අතරමැදි යෙදවුම් වල වටිනාකම	390

ආර්ථිකයේ ශුද්ධ අපනයන කොපමණ වේ ද?

(1) රු. බිලියන 470 (2) රු. බිලියන 1600 (3) රු. බිලියන 100
(4) රු. බිලියන 900 (5) රු. බිලියන 150

27. වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතයෙන් මුර්ත දළ දේශීය නිෂ්පාදිතය ලබා ගැනීම සඳහා කළ යුතු ගැලපීම කුමක් ද?

(1) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතයෙ ÷ මුර්ත දළ දේශීය නිෂ්පාදිතය
(2) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතයේ ÷ මිල දර්ශකය
(3) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතයේ - නිෂ්පාදිතය මත ශුද්ධ චක්‍ර බදු
(4) මුර්ත දළ දේශීය නිෂ්පාදිතය - ශුද්ධ අපනයන
(5) මුර්ත දළ දේශීය නිෂ්පාදිතය + විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම

28. ආර්ථිකයක සමාහාර ඉල්ලුම රුපියල් බිලියන 450 කින් වැඩි කිරීමට අපේක්ෂා කරනු ලබයි. එම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැමියාව 0.9 ක් නම්, බදු අඩු කළ යුතු ප්‍රමාණය කොපමණ ද?

(1) රුපියල් බිලියන 50
(2) රුපියල් බිලියන 45
(3) රුපියල් බිලියන 220
(4) රුපියල් බිලියන 450
(5) රුපියල් බිලියන 55

29. කිසියම් ආර්ථිකයක බදු ගුණකය 4 වන විට එම ආර්ථිකයේ, ආන්තික පරිභෝජන නැමියාව හා රාජ්‍ය වියදම් ගුණකය වන්නේ,

(1) ආන්තික පරිභෝජන නැමියාව 0.2 වන අතර රාජ්‍ය වියදම් ගුණකය 5 කි.
(2) ආන්තික පරිභෝජන නැමියාව 0.8 වන අතර රාජ්‍ය වියදම් ගුණකය 5 කි.
(3) ආන්තික පරිභෝජන නැමියාව 0.8 වන අතර රාජ්‍ය වියදම් ගුණකය 4 කි.
(4) ආන්තික පරිභෝජන නැමියාව 0.4 වන අතර රාජ්‍ය වියදම් ගුණකය 3 කි.
(5) ආන්තික පරිභෝජන නැමියාව 0.2 වන අතර රාජ්‍ය වියදම් ගුණකය 4 කි.

30. කල්පිත ආර්ථිකයක සංඛ්‍යා දත්ත කිහිපයක් පහත දැක්වේ. සංඛ්‍යා රුපියල් බිලියන වලින් දැක්වේ

පූර්ණසේවා නියුක්ති සමතුලිත ජාතික ආදායම 2 000

පරිභෝජනය $C= 200+0.8\ Y$

මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම රුපියල් බිලියන 2400 දී උද්ධමන වියදම් පරතරය කොපමණ වේ ද?

(1) රු. බිලියන 2000 (2) රු. බිලියන 200 (3) රු. බිලියන 200

(4) රු. බිලියන 400 (5) රු. බිලියන 80

31. කල්පිත ආර්ථිකයක පෞද්ගලික පරිභෝජනය හා දළ ආයෝජනය පමණක් පවතින බව සලකන්න, පරිභෝජන සමීකරණය $C= 100+0.9\ Y$ වන අතර සමතුලිත ජාතික ආදායම රුපියල් බිලියන 2000 කි. එම ආර්ථිකයේ ආයෝජනය කොපමණ වේද?

(1) 200 (2) 460 (3) 140

(4) 100 (5) 150

32. මුදල් ඉල්ලුම් වක්‍රයක් පහළට ගමන් කිරීමට හේතු වන සාධකයක් විය හැක්කේ,

(1) සමපේක්ෂණ චේතනාවෙන් පොලී අනුපාතය වැඩි වීම නිසා ළඟ තබාගන්නා මුදල් ප්‍රමාණය අඩු කරන නිසාය.

(2) ගනුදෙනු කිරීම සඳහා ළඟ තබාගන්නා මුදල් ප්‍රමාණය වැඩි වීමට මූර්ත ආදායම වැඩි වීම හේතුවන නිසාය.

(3) සමපේක්ෂණ චේතනාවෙන් පොලී අනුපාතය වැඩි වීම නිසා ළඟ තබාගන්නා මුදල් ප්‍රමාණය වැඩි කරන නිසාය.

(4) ආරක්ෂණ චේතනාව මත ළඟ තබාගන්නා මුදල් ප්‍රමාණය අඩු වීමට මූර්ත ආදායම අඩු වීම හේතුවක් වන නිසාය.

(5) ආරක්ෂණ චේතනාව මත ළඟ තබාගන්නා මුදල් ප්‍රමාණය අඩු වීමට උද්ධමනය හේතුවක් වන නිසාය.

33. ආර්ථිකයක ඉල්ලුම් උද්ධමනයක් ඇති වීමට පහත කුමන හේතුවක් බලපානු ලබයි ද?

(1) ශ්‍රමික වැටුප් ඉහළ යාමක්

(2) නිෂ්පාදන පිරිවැය ඉහළ යාමක්

(3) මුදල් සැපයුමේ සංකෝචනයක්

(4) පොළී අනුපාතය අඩු වීමක්

(5) සෘජු බදු ඉහළ යාමක්

34. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමට (M2b) අයත් මූල්‍ය සංරචකයක් වන්නේ කුමක් ද?

(1) භාණ්ඩාගාර බිල්පත්

(2) භාණ්ඩාගාර බැදුම්කර

(3) මහජනයා වාණිජ බැංකු වල පවත්වාගෙන යන කාලීන හා ඉතුරුම් තැන්පතු

(4) වාණිජ බැංකු මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන තැන්පතු

(5) වාණිජ බැංකුවල පවත්නා සංචිත

35. ආර්ථිකයක මුදලේ සංසරණ ප්‍රවේගය හා මූර්ත නිෂ්පාදිතය ස්ථාවරව පවතින විට මිල මට්ටම 10% කින් ඉහළ යාමට පහත කුමක් බලපානු ලබයි ද?

(1) පොළී අනුපාතය 10% කින් වැඩි වීම.

(2) පොළී අනුපාතය 10% කින් අඩු වීම.

(3) මුදල් සැපයුම 10% කින් අඩු වීම.

(4) මුදල් සැපයුම 10% කින් වැඩි වීම.

(5) ආර්ථික වෘද්ධිය 10% කින් වැඩි වීම.

36. පුද්ගලයකු වර්තමානයේ දී පිළිණපත් වැඩිපුර මිලදී ගැනීමට යොමු වන්නේ,

(1) පිළිණපත් වල භූවමාරු වටිනාකම අනාගතයේ අඩු වෙතැයි අපේක්ෂා කිරීමයි.

(2) පොළී අනුපාතය අනාගතයේ දී වැඩි වෙතැයි අපේක්ෂා කිරීමයි.

(3) මූර්ත අදායම අඩු වීම නිසායි.

(4) ආරක්ෂණ චේතනාව තුළ කටයුතු කිරීමයි.

(5) පොළී අනුපාතය අනාගතයේ දී අඩු වෙතැයි අපේක්ෂා කිරීමයි.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

37. පදනම් මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථිකයට මුදා හැරීමට බලපාන හේතුවක් වන්නේ,
(1) මහ බැංකුව රජයට ලැබෙන විදේශ විනිමය මිලදී ගැනීම නිසාය.
(2) අනෙකුත් රාජ්‍ය ආයතන මහ බැංකුවේ පවත්වා ගෙන යන තැන්පතු ඉහළ යාම නිසාය.
(3) විනිමය අනුපාතය ස්ථාවර වීම නිසාය.
(4) උද්ධමනය ඉහළ යාම නිසාය.
(5) මහ බැංකුව විදේශ විනිමය අළෙවි කිරීම නිසා ය.

38. පහත දැක්වෙන දෑ අතරින් ධන බාහිරතාවයක් ලෙස සැලකිය හැක්කේ කුමක්ද?
(1) කර්මාන්ත ශාලාවක ශබ්ද දූෂණය (2) බෝ වෙන රෝග වලක්වා ගැනීම
(3) පෞද්ගලික මෝටර් රථ පරිහරණය (4) පොසිල ඉන්ධන දහනය
(5) මත්ද්‍රව්‍ය භාවිතය

39. කිසියම් නිෂ්පාදන ක්‍රියාවක් නිසා හටගනු ලබන බාහිරතාවයක් ප්‍රස්තාරයෙන් නිරූපණය වේ. එම ප්‍රස්තාරයට අනුව, අභිමිවන සුභසාධනය නිරූපනය වන්නේ
(1) **A** මගින් ය.
(2) **B** මගින් ය.
(3) **C** මගින් ය.
(4) **D** මගින් ය.
(5) **A** හා **B** මගින් ය.



40. ශ්‍රී ලංකාවේ පුනරාවර්තන වියදමේ වැඩිම වියදම් සංරචකය වන්නේ,
(1) කුටුම්භ සංක්‍රාම වේ
(2) වැටුප් හා වේතන වේ
(3) පරිපාලන වියදම් වේ
(4) රාජ්‍ය ආයතන වල සංක්‍රාම වේ
(5) රාජ්‍ය ණය පොළිය වේ

41. පහත දැක්වෙනනේ රාජ්‍ය අයවැය ලේඛණයට අදාල සංකල්ප කිහිපයකි. අයවැය ශේෂය නිරූපනය වන්නේ කුමන පිළිතුරෙන් ද?

A	රාජ්‍ය ආදායම	**B**	පුනරාවර්තන වියදම	**C**	රජයට ලැබුණු ප්‍රදාන
D	ප්‍රග්ධන වියදම	**E**	ශුද්ධ ණයදීම්	**F**	බදු නොවන ආදායම

(1) **A-B+C** (2) **A+B-(C+D+E)** (3) **D+B+C**
(4) **A+C-(B+D+E)** (5) **A+C+F-(B+D+E)**

42. ආර්ථිකයක සමාහාර ඉල්ලුම වැඩි කිරීමට උචිත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් වන්නේ,
(1) නාමික පොලී අනුපාතය ඉහළ දැමීමයි.
(2) නාමික පොලී අනුපාතය පහළ දැමීමයි.
(3) අතිරික්ත අයවැයක් පැවතීමය.
(4) හිඟ අයවැයක් පැවතීමය.
(5) රාජ්‍ය බදු ඉහළ දැමීමයි.

43. ආරක්ෂණවාදී ප්‍රතිපත්තියක් ලෙස තීරු බද්දක් මගින් දේශීය නිෂ්පාදකයන්ට නාමික ආරක්ෂණයක් ලබාදිය හැක්කේ,
(1) දේශීය භාණ්ඩ සඳහා සහනාධාර ලබාදීමෙන්
(2) ආනයන සලාක නියම කිරීමෙනි
(3) අපනයන භාණ්ඩ මත තීරු බදු අය කිරීමෙනි
(4) ආනයන භාණ්ඩ මත තීරු බදු අය කිරීමෙනි
(5) ප්‍රපාතනය මගිනි

44. ඇමරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට පැනවූ තීරුබදු වැඩි කිරීම නිසා ශ්‍රී ලංකාවට ඇතිවන අවාසිය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ගයක් වන්නේ පහත දැක්වෙන දෑ අතරින් කුමක්ද?

(1) ශ්‍රී ලංකාවද තීරුබදු වැඩි කිරීම තුලින් ඇමරිකා එක්සත් ජනපදයට ප්‍රතිප්‍රහාර එල්ල කිරීම

(2) ඇමරිකා එක්සත් ජනපදයේ කොන්දේසි වලට යටහත්ව කටයුතු කිරීම

(3) ඇමරිකා එක්සත් ජනපදයට ආර්ථික සම්බාධක පැනවීම

(4) ඇමරිකාවට කරනු ලබන ශ්‍රී ලාංකික අපනයන නතර කිරීම

(5) අපනයන වෙළෙඳපොළ විවිධාංගීකරණය කිරීම

45. කිසියම් කල්පිත ආර්ථිකයක භාණ්ඩ වෙළෙඳ අනුපාතය වර්තමානයේ 96 කි. එම රටේ අපනයන මිල දර්ශකය පාදක වර්ෂයට සාපේක්ෂව 20% න් වැඩි වී ඇත්නම්, ආනයන සඳහා එම රට ගෙවා ඇති සාමාන්‍ය මිල වෙනස් වී ඇත්තේ කොපමණ ද?

(1) 25% න් වැඩි වී ඇත. (2) 24% න් වැඩි වී ඇත. (3) 20% න් අඩු වී ඇත.

(4) 21% න් අඩු වී ඇත. (5) 4% න් වැඩි වී ඇත.

46. 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ප්‍රධානතම විදේශ වෙළෙඳ හවුල්කරු වූයේ,

(1) ඉන්දියාවයි. (2) එක්සත් රාජධානියයි. (3) චීනයයි

(4) ජර්මනියයි. (5) ඇමරිකාවයි.

47. පහත සඳහන් දෑ අතරින් ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ ද්විතීක ආදායම් ගිණුමට ඇතුළත් කරනු ලබන්නේ කුමක්ද?

(1) වෙළෙඳ භාණ්ඩ අපනයන

(2) භාණ්ඩ අපනයනය සඳහා නාවික සමාගමකට ප්‍රවාහන ගාස්තු ගෙවීම

(3) සේවා නියුක්ති ප්‍රෙෂණ ලැබීම

(4) සංචාරක ඉපයීම්

(5) ප්‍රති ආයෝජන ඉපයීම්

48. කිසියම් ආර්ථිකයක ගෙවුම් ශේෂයට අදාළ දත්ත කිහිපයක් පහත දැක්වේ. සංඛ්‍යා රුපියල් බිලියන වලිනි. ආර්ථිකයේ ශුද්ධ අපනයන කොපමණ ද?

(1) රුපියල් බිලියන -1 500

(2) රුපියල් බිලියන 1 500

(3) රුපියල් බිලියන -1 600

(4) රුපියල් බිලියන 1 600

(5) රුපියල් බිලියන -900

අයිතමය	හර	බැර
මූල්‍ය නොවන රන්	25	125
වෙළෙඳ භාණ්ඩ	2 150	1 250
සේවා හුවමාරුව	1 100	400

49. ගෙවුම් ශේෂයේ ප්‍රති අපනයන ඉපයීම් ද්විත්ව සටහනක් ලෙස සටහන් වන්නේ,

	හර	බැර
(1)	භාණ්ඩ ගිණුම	ප්‍රාග්ධන ගිණුම
(2)	ද්විතීක ආදායම් ගිණුම	මූල්‍ය ගිණුම
(3)	ප්‍රාථමික ආදායම් ගිණුම	මූල්‍ය ගිණුම
(4)	මූල්‍ය ගිණුම	සේවා ගිණුම
(5)	භාණ්ඩ ගිණුම	භාණ්ඩ ගිණුම

50. පහත සඳහන් දෑ අතරින් 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ ශේෂය සම්බන්ධව නිවරදි ප්‍රකාශය වන්නේ පහත කුමක් ද?

(1) අතිරික්තයක් වාර්තා වීම

(2) හිඟයක් වාර්තා වීම

(3) තුලනය වීම

(4) ප්‍රාග්ධන ගිණුමේ ශේෂයට සමාන වීම

(5) මූල්‍ය ගිණුමේ ශේෂයට සමාන වීම

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

දෙවන වාර පරීක්ෂණය - 2025

ශ්‍රේණිය
13

විෂයය :- ආර්ථික විද්‍යාව II

පාසලේ නම : .....

ඇතුළත්වීමේ අංකය : .....

කාලය : පැය 03 මි.10යි

සැලකිය යුතුයි :

- "අ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, "ආ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

"අ" උප කොටස
(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

(1)

i. අසීමිත සැපයුමක් ඇති නිෂ්පාදන සම්පත් ආර්ථික සම්පත් වේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. ස්වාභාවික ප්‍රාග්ධනය හඳුන්වන්න. (ලකුණු 3)

iii. ආන්තික ආවස්ථික පිරිවැය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. ස්වාර්ථය, වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක තීරණ ගනු ලබන විවිධ පාර්ශ්වයන්ගේ හැසිරීම තීරණය කරනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 4)

v. කිසියම් ආර්ථිකයක් තම නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත නිෂ්පාදනයේ නිරත වීමේදී සම්පත් බෙදීයාමේ අකාර්යක්ෂමතාවයක් පැවතිය හැකි ද? පැහැදිලි කරන්න. (ලකුණු 5)

(2)

i. ඉල්ලුම් නීතිය යන්නෙන් කුමක් අදහස් වේ ද? එය ප්‍රමාණ අක්ෂයට සමාන්තරව ගමන් කරනු ලබන ඉල්ලුම් වක්‍රයකින් ප්‍රකාශ වේ ද? (ලකුණු 4)

ii. භාණ්ඩයක සැපයුම තීරණය කරන සාධක මොනවා ද? (ලකුණු 4)

iii. ආදේශන ප්‍රතිවිපාකය සෘණ වීම හා ආදායම් ප්‍රතිවිපාකය ද සෘණ වීම ගිෆන් භාණ්ඩයක මෙන්ම බාල භාණ්ඩයක ද පොදු ලක්ෂණයකි. එසේ නම් ගිෆන් භාණ්ඩයක සමස්ත මිල ප්‍රතිවිපාකය ධන වන්නේත් බාල භාණ්ඩයක එය සෘණ වන්නේත් ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. පාරිභෝගිකයෙකුගේ පාරිභෝගික අතිරික්තය හා වෙළෙඳපොළ පාරිභෝගික අතිරික්තය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. ආදායම් ඉල්ලුම් නම්‍යතාවය හා මිල ඉල්ලුම් නම්‍යතාවය යන්නෙන් කුමක් අදහස් වේ ද? එය ගණනය කරනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 4)

(03)

i. සාමාන්‍ය භාණ්ඩයක් සඳහා රජයක් නිෂ්පාදකයන් මත ඒකක සහනාධාරයක් ලබා දුන් විට ඇතිවන අහිමිවන සුභසාධනය හා නිෂ්පාදන අතිරික්තයේ ඇතිවන වෙනස රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. අවම සැපයුම් මිලක් සමතුලිත මිලට වඩා ඉහළින් නම් කළ විට ආර්ථික අතිරික්තයට වන බලපෑම රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. (අ) භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාවය -0.4 කි. සැපයුම් නම්‍යතාවය 1.6කි. රජය විසින් මෙම භාණ්ඩය මත රුපියල් 80 ක ඒකක බද්දක් අය කළ විට, බද්දට පෙර සමතුලිත ප්‍රමාණය 2500 ක් වූ අතර බද්දෙන් පසු සමතුලිත ප්‍රමාණය 2400 ක් වේ නම් රජයේ බදු ආදායම හා පාරිභෝගික බදු බර කොපමණ වේ ද? (ලකුණු 4)

(ආ) අහිමිවන සුභසාධනය කොපමණ වේ ද? (ලකුණු 2)

iv. කෘෂි භාණ්ඩවල මිල අස්ථායිතාවයක් ඇතිවීමට බලපාන හේතු මොනවා ද? (ලකුණු 6)

(04)

i. කෙටිකාලීන ස්ථාවර පිරිවැය හා ආරෝපිත පිරිවැය සඳහා උදාහරණ දෙක බැගින් ලියා දක්වන්න. (ලකුණු 4)

ii. කෙටි කාලයේදී නිමැවුම වැඩි වන විට මුලු ස්ථාවර පිරිවැය ස්ථාවරව පවතින විට සාමාන්‍ය ස්ථාවර පිරිවැයද ස්ථාවරව පවතී ද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. පූර්ණ තරගකාරී ආයතනයකට ලාභ උපරිම සමතුලිත නිමැවුම් මට්ටම තෝරා ගැනීම සඳහා ආන්තික පිරිවැය වැදගත් වන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. (අ) රූප සටහනක් ඇසුරින් කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී ආයතනයක් ප්‍රාමාණික ලාභ ලබමින් පවතින අවස්ථාවක වෙළෙඳපොළ සැපයුම වැඩි වීම නිසා එය ආර්ථික අලාභ තත්ත්වයකට පත්වන අවස්ථාවක් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(ආ) පූර්ණ තරගකාරී ආයතනයක සැපයුම වැඩි වන විට මිල වෙනස් වේ ද? (ලකුණු 2)

(05)

i. නිමැවුම් ප්‍රවේශයේ දී වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය හා මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනු ලබන්නේ කෙසේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. කිසියම් ආර්ථිකයක පෞද්ගලික පරිභෝජනය රුපියල් බිලියන 8000 ක් වූ අතර, රාජ්‍ය පරිභෝජන වියදම රුපියල් බිලියන 9000 ක් විය. එරටේ වැය කළ හැකි දළ ජාතික ආදායම රුපියල් බිලියන 27000 ක් වූ අතර විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම රුපියල් බිලියන 1800 ක් විය.

(අ) දළ ජාතික ආදායම කොපමණ ද?

(ආ) ජාතික ඉතුරුම් කොපමණ ද? (ලකුණු 4)

iii. දළ දේශීය නිෂ්පාදිතය මිලදී ගැනීම සඳහා කිසියම් කාල පරිච්ඡේදයක් තුළ ආර්ථිකයේ කරනු ලබන වියදම් සංරචක මොනවා ද? (ලකුණු 4)

iv. කාන්දුවීම් හා විදීම් විවෘත ආර්ථිකයක් ඇසුරෙන් ප්‍රකාශ කරන්න. (ලකුණු 6)

v. ආයෝජන ගුණකය යන්නෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 2)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

(06)

i. හොඳ මුදලක ලක්ෂණ මොනවා ද? (ලකුණු 4)

ii. පොලී අනුපාතය මුදල් ඉල්ලුම අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 5)

iii. මුදල් ප්‍රමාණවාදයට අනුව උද්ධමනයක් ඇතිවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. මූලික උද්ධමනය යන්නෙන් කුමක් අදහස් වේ ද? ශ්‍රී ලංකාවේ මූලික උද්ධමනය ගණනය කිරීමේ දී බැහැර කරන භාණ්ඩ කාණ්ඩ මොනවා ද? (ලකුණු 5)

v. ශ්‍රී ලංකාවේ උද්ධමනය ප්‍රකාශ කිරීම සඳහා යොදා ගන්නා නිළ පාරිභෝගික මිල දර්ශක දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(07)

i. පදනම් මුදල් මොනවා ද? (ලකුණු 4)

ii. පදනම් මුදල් හා මුදල් සැපයුම් අතර වෙනස පැහැදිලි කරන්න. ලකුණු 4)

iii. කිසියම් ආර්ථිකයක පටු මුදල් සැපයුම රුපියල් බිලියන 5000ක් වන අතර මහජනයා සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණයේ රුපියල් බිලියන 1500කි. වාණිජ බැංකුව 10%ක ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයකට යටත් බව සලකන්න. වාණිජ බැංකු පද්ධතියේ අධි සංචිත රුපියල් බිලියන 150 කි.

(අ) මුදල් ගුණකය කොපමණ ද? (ලකුණු 4)

(ආ) මහ බැංකුව රුපියල් බිලියන 40 ක සුරැකුම්පත් විවෘත වෙළෙඳපොළෙන් මිලදී ගන්නා විට මුදල් සැපයුම කොපමණ වෙනස් වේ ද? (ලකුණු 2)

iv. පොලී අනුපාත කොරිඩෝව එක් දින තනි ප්‍රතිපත්ති පොලී අනුපාතය යටතේ ක්‍රියාත්මක වන්නේ කෙසේ ද? (ලකුණු 6)

(08)

i. පොදු භාණ්ඩයක ප්‍රධාන ලක්ෂණ උදාහරණයක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක වැදගත්කම් මොනවා ද? (ලකුණු 4)

iii. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ධාරිතාවය හා රාජ්‍ය ණය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට එහි මෑත කාලීන ප්‍රවණතා මොනවා ද? (ලකුණු 4)

iv. අයවැය හිඟයක් තුළ රටක දළ මූල්‍යනය අවශ්‍යතාවය රුපියල් බිලියන 8000 කි. ඉන් ණය ආපසු ගෙවීම රුපියල් බිලියන 3000 කි. දීමනා ඇතුළත් රාජ්‍ය අයභාරය රුපියල් බිලියන 4000 ක් වේ නම්,


(අ) රාජ්‍ය මුළු වියදම කොපමණ ද? (ලකුණු 2)

(ආ) රාජ්‍ය වියදමෙන් 18%ක් ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් වේ නම්, වර්තන වියදම කොපමණ ද? (ලකුණු 2)

v. සෘජු බදු යනු කවරේ ද? ශ්‍රී ලංකා රජයේ සෘජු බදු කිහිපයක් නම් කරන්න. (ලකුණු 4)

(09)

i. කිසියම් රටවල් දෙකක නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර දෙක පහතින් දැක්වේ. එම රටවල් ප්‍රාග්ධන භාණ්ඩ හා පරිභෝජන භාණ්ඩ නිපදවනු ලබයි.



(අ) කුමන රටක් කුමන භාණ්ඩ සඳහා නිරපේක්ෂ වාසි හිමිකර ගන්නේ ද? (ලකුණු 2)

(ආ) සාපේක්ෂ වාසියක් රටවල් වලට දිනා ගත හැකි වේ ද? (ලකුණු 2)

(ඉ) A රටට බලපෑ යුධමය වාතාවරණය නිසා සම්පත් විනාශ වී නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන් වේ. එය B රටේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට සම වුව හොත් නිරපේක්ෂ හා සාපේක්ෂ වාසි රට වලට ඇති වේ ද? (ලකුණු 4)

ii. (අ) නාමික ආරක්ෂණ අනුපාතය යනු කුමක් ද? (ලකුණු 2)

(ආ) කිසියම් රටක දේශීයව නිපදවනු ලබන භාණ්ඩයක මිල රුපියල් 80000 ක් බව සලකන්න. ඒ සඳහා ආනයනික යෙදවුම් වශයෙන් රුපියල් 30000 ක යෙදවුම් භාවිතා කරනු ලබයි. ඒ හා සමාන භාණ්ඩයක් පිට රටින් එම මිලටම ආනයනය කරන බව සලකන්න. ආනයනය මත 20% ක තීරු බද්දක් අය කරන විට සඵල ආරක්ෂණ අනුපාතය කොපමණ වේ ද? (ලකුණු 4)

iii.(අ) ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය ලැබීම් හතර ඒවායේ අනුපිළිවෙල අනුව ලියා දක්වන්න. (ලකුණු 4)

(ආ) ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන දිශාවට අදාළ රටවල් දෙක මොනවා ද? (ලකුණු 2)

(10)

i. ගෙවුම් ශේෂයේ සේවා ගිණුමට ආදල ලැබීම් පහක් ලියා දක්වන්න. (ලකුණු 5)

ii. භාණ්ඩ ගිණුමේ ශේෂය හා ශුද්ධ අපනයන අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. පහත දැක්වෙන ගනුදෙනු ගෙවුම් ශේෂ ලේඛනයේ කුමන ගිණුමකට අයත් වේ ද?

(අ) ප්‍රති ආයෝජන ඉපයීම්
(ආ) රජයේ ණය කපා හැරීම්
(ඉ) මූල්‍ය නොවන රන් ආශ්‍රිත ගනුදෙනු
(ඊ) සේවා නියුක්ති ප්‍රේෂණ (ලකුණු 4)

iv. අවශේෂ ලෝකය සමඟ කරන ලද ආර්ථික ගණුදෙනු අන්තර්ගත කිසියම් රටක ගෙවුම් ශේෂයට අදාළ දත්ත කීපයක් පහතින් දක්වා ඇත. (රුපියල් බිලියන)

අවශේෂ ලෝකය සමඟ කරන ලද ආර්ථික ගණුදෙනු	බැර	හර
වෙළෙඳ භාණ්ඩ හා මූල්‍ය නොවන රන්	4000	6800
සේවා	3000	1900
ප්‍රාථමික ආදායම්	2800	3200
ද්විතීක ආදායම්	1800	100

අ) ජංගම ගිණුමේ ශේෂය කොපමණ ද? (ලකුණු 5)

(ආ) ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තය රුපියල් බිලියන 40 ක් වේ නම්, ප්‍රාග්ධන ගිණුමේ ශේෂය කොපමණ ද? (ලකුණු 2)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

උසස් පෙළ ආර්ථික විද්‍යාව - පිළිතුරු පත්‍රය -2025

13 ශ්‍රේණිය දෙවන වාර පරීක්ෂණය

ආර්ථික විද්‍යාව I

(01)	1	(11)	5	(21)	4	(31)	4	(41)	5
(02)	2	(12)	5	(22)	4	(32)	1	(42)	4
(03)	5	(13)	1	(23)	4	(33)	4	(43)	4
(04)	2	(14)	4	(24)	2	(34)	3	(44)	5
(05)	1	(15)	1	(25)	4	(35)	4	(45)	1
(06)	3	(16)	3	(26)	3	(36)	5	(46)	1
(07)	1	(17)	3	(27)	2	(37)	1	(47)	3
(08)	4	(18)	1	(28)	1	(38)	2	(48)	1
(09)	1	(19)	5	(29)	2	(39)	2	(49)	4
(10)	2	(20)	5	(30)	5	(40)	5	(50)	1

ආර්ථික විද්‍යාව I I

(01)

(i) i. නැත, සීමිත සැපයුමක් සහිත නිෂ්පාදන ක්‍රියාවලියකට යොදා ගනු ලබන ආවස්ථික පිරිවැයක් සහිත නිෂ්පාදන නිෂ්පාදන සාධක ආර්ථික සම්පත් වේ

අසීමිත සැපයුමක් සහිත නිෂ්පාදන ක්‍රියාවලියකට යොදා ගත හැකි ශූන්‍ය මිලක් සහිත නිෂ්පාදන සම්පත් ආර්ථික නොවන සම්පක් වේ

(ලකුණු 4)

(ii) - ස්වාභාවික ප්‍රාග්ධනය සමස්ත පරිසර පද්ධති සහ ඒවා තුළ සිදුවන පාරිසරික ක්‍රියාවලීන් ද ආවරණය වන මානව යහපැවැත්ම සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සේවා සපයන අත්‍යවශ්‍ය වත්කමකි. මෙම සේවාවන් බොහෝ විට පරිසර පද්ධති සේවා ලෙස හඳුන්වනු ලබන අතර ජීවිතයට ආධාර කිරීම, ආහාර සහ ජලය සැපයීම, දේශගුණය නියාමනය කිරීම, රෝග පාලනය කිරීම සහ තවත් බොහෝ දේ සඳහා මූලික වේ.


මෙයට ඇතුළත් වන්නේ වනාන්තර, තෙත්බිම්, සාගර, තණ බිම් සහ අනෙකුත් ස්වාභාවික වාසස්ථාන සහ ජල පිරිපහදු කිරීම, පරාගණය, දේශගුණ නියාමනය සහ පෝෂක වැනි පරිසර පද්ධති සේවා වේ.

උදාහරණයක් ලෙස පරාගණය අපගේ කුසගින්න අඩු කර ගැනීමට ගස් වලට ඵල ලබා දෙන ස්වභාවික පරිසර පද්ධති සේවා වකි, තවද වනාන්තර ආර්ථික ක්‍රියාකාරකම් වලට පමණක් නොව අපට හුස්ම ගන්නට ඔක්සිජන් ලබාදේ

(ලකුණු 03)

(iii) ආන්තික ආවස්ථික පිරිවැය යන්නෙන් අදහස් වන්නේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මත එක් භාණ්ඩයකින් ඒකකය බැගින් නිෂ්පාදනය වැඩි කරන විට, අනෙක් භාණ්ඩයෙන් කැපකිරීමට සිදුවන ප්‍රමාණයයි. (ලකුණු 2)

නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක බෑවුමෙන්ද නිරූපණය වන්නේ ආන්තික ආවස්ථික පිරිවැයයි.



ඉහත සරල රේඛීය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ බැවුම නිරූපණය කරන්නේ ආවස්ථික පිරිවැයයි. එය සෑම විටම ස්ථාවරව පවතී. (ලකුණු 2)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

(iv) වෙළෙඳපොළ ආර්ථිකයක පාරිභෝගිකයන්, නිෂ්පාදකයන් හා සාධක හිමියන් තම ප්‍රතිලාභ උදෙසා තාර්කිකව කටයුතු කිරීම මින් අදහස් වේ. ස්වාර්ථය යන්නෙන් ආත්මාර්ථය අදහස් නොවන අතර තම ප්‍රතිලාභ උදෙසා තාර්කිකව හැසිරෙන ආකාරයක් මින් අදහස් වේ. (ලකුණු 2)

ස්වාර්ථය වෙළෙඳපොළ ආර්ථිකයක හැසිරීම තීරණය කරනු ලබන මූලික බලවේගය වන අතර පාරිභෝගිකයන්, නිෂ්පාදකයන්, සාධක හිමියන් තම ප්‍රතිලාභ වැඩි කර ගැනීමට විවිධත්වයෙන් යුතුව වෙළෙඳපොළ තුළ හැසිරෙනු ලබයි. (ලකුණු 2)

(iv) පැවතිය හැකිය. (ලකුණු 1)

රටක් අඩු යෙදවුම් ප්‍රමාණයකින් වැඩි නිමැවුමක් බිහි කරන විටදී හෝ අඩුම සම්පත් පිරිවැයක් යටතේ භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කරන විට නිෂ්පාදන කාර්යක්ෂමතාවය ඇති වී, ඒ රට තම නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත ලක්ෂයක නිෂ්පාදනයේ නිරත වේ. එහිදී පූර්ණ සේවා නියුක්තියක් හා පූර්ණ නිෂ්පාදනයක් බිහි කර ගත යුතුය. (ලකුණු 2)

නමුත් සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාවයක් පැවතිය හැකිය. සමාජයට වඩාත් අවශ්‍ය කරන හා සමාජ වරණයක් ඇති භාණ්ඩ හා සේවා නිපදවීමට වැඩි සම්පත් ප්‍රමාණයක් යොමු නොකිරීම එයට හේතු වේ. (ලකුණු 1)

එහිදී ආන්තික ප්‍රතිලාභ ආන්තික පිරිවැයට අසමාන වීමෙන් අකාර්යක්ෂම වේ. (ලකුණු 1)

(02)

(i)

ඉල්ලුම් නීතිය යනු මිල හැර ඉල්ලුමට බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව පවතින විට සලකා බලන භාණ්ඩයේ මිලත් ඉල්ලුම් ප්‍රමාණයත් අතර ඇතිවන ප්‍රතිලෝම සම්බන්ධතාවයි. (ලකුණු 2)

පූර්ණ නම්‍ය ඉල්ලුමක් තුළ මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් ඇති නොවේ. එය ප්‍රමාණ අක්ෂයට සමාන්තරව ගමන් කරන නිසා මිල වෙනස් නොවී ඉල්ලුම් ප්‍රමාණය පමණක් වෙනස් වේ. (ලකුණු 2)

(ii) සැපයුමට බලපාන සාධක

සලකා බලන භාණ්ඩයේ මිල
තාක්ෂණය
යෙදවුම් මිල
සම්බන්ධිත භාණ්ඩ මිල
නිෂ්පාදකයන්ගේ අපේක්ෂා
රජයේ ප්‍රතිපත්ති
සැපයුම්කරුවන් සංඛ්‍යාව

. වෙනත් සාධක (ලකුණු 4

(iii) බාල භාණ්ඩයක මෙන්ම ගිෆන් භාණ්ඩයක ආදේශන ප්‍රතිවිපාකය සෘණ වේ. බාල භාණ්ඩයක මෙන්ම ගිෆන් භාණ්ඩයක මිල වෙනස් වීමෙන් ආදේශන ප්‍රතිවිපාකයට අනුව ඉල්ලුම් ඊට ප්‍රතිලෝමව වෙනස් වේ. (ලකුණු 1)

බාල භාණ්ඩයක මෙන්ම ගිෆන් භාණ්ඩයක ආදායම් ප්‍රතිවිපාකය ද සෘණ වේ. මෙම භාණ්ඩ දෙවර්ගයේම මිල වෙනස් වීමේදී මූර්ත ආදායම මත ඇති කරනු ලබන බලපෑම මත ඉල්ලුම් ප්‍රමාණය වෙනස් කරනුයේ ඊට ප්‍රතිලෝම දිශාවට ය. (ලකුණු 1)

නමුත් බාල භාණ්ඩයක ස්වභාවය වන්නේ සෘණ ආදායම් ප්‍රතිවිපාකය නිශේධනය කරමින් සෘණ ආදේශන ප්‍රතිවිපාකය ප්‍රබල වීමෙන් මිල ප්‍රතිවිපාකය සෘණ වීමයි. එවිට බාල භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වේ. (ලකුණු 2)

නමුත් ගිෆන් භාණ්ඩයක ස්වභාවය වන්නේ සෘණ ආදේශන ප්‍රතිවිපාකය ඉක්මවා සෘණ ආදායම් ප්‍රතිවිපාකය ප්‍රබල වන විට මිල ප්‍රතිවිපාකය ධන වීමයි. එවිට ඉල්ලුම් වක්‍රය ඉහළට බෑවුම් වේ. (ලකුණු 2)

(iv) පාරිභෝගික අතිරික්තය යනු පාරිභෝගිකයෙකු භාණ්ඩයක් සඳහා ගෙවීමට කැමති උපරිම මිලත් සත්‍ය වශයෙන් එම භාණ්ඩය සඳහා ගෙවන මිලත් අතර වෙනසයි. පාරිභෝගිකයා කිසියම් භාණ්ඩ ඒකක කිහිපයක් මිලදී ගන්නා විට පාරිභෝගික අතිරික්තය වන්නේ එක් එක් භාණ්ඩයක් සඳහා වූ පාරිභෝගික අතිරිතයන්ගේ එකතුවයි. වෙළෙඳපොළ පාරිභෝගික අතිරික්තය වන්නේ වෙළෙඳපොලේ සියලුම ගැනුම්කරුවන් ගේ පාරිභෝගික අතිරික්තයන්ගේ එකතුවයි. (ලකුණු 4)

(iv). ආදායම් ඉල්ලුම් නම්‍යතාවය යනු පාරිභෝගික ආදායම හැර ඉල්ලුමට බලපාන අන් සාධක ස්ථාවරව පවතින විට පාරිභෝගික අදායමේ ඇතිවන ප්‍රතිශතයමය වෙනසට සාපේක්ෂව ඉල්ලුම් ප්‍රමාණය දක්වන්නා වූ සංවේදීතාවය මැන දැක්වීමයි.
මිල ඉල්ලුම් නම්‍යතාවය යනු මිල හැර ඉල්ලුමට බලපාන අන් සාධක ස්ථාවරව පවතින විට සලකා බලන භාණ්ඩයේ මිලේ ඇතිවන ප්‍රතිශතමය වෙනසට සාපේක්ෂව ඉල්ලුම් ප්‍රමාණය දක්වන්නා වූ සංවේදීතාවය මැන දැක්වීමයි.
(ලකුණු 2)

ආදායම් ඉල්ලුම් නම්‍යතාවය = ඉල්ලුම් ප්‍රමාණයේ ප්‍රතිශතමය වෙනස
ආදායමේ ප්‍රතිශතමය වෙනස


මිල ඉල්ලුම් නම්‍යතාවය = ඉල්ලුම් ප්‍රමාණයේ ප්‍රතිශතමය වෙනස
මිලේ ප්‍රතිශතමය වෙනස (ලකුණු 2)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

(03)

(i) (iv) සාමාන්‍ය භාණ්ඩයක් සඳහා සහනාධාරයක් ලබා දුන් විට නිෂ්පාදන අතිරික්තය වැඩිවේ.



(ලකුණු 2)


අභිමිවන සුභසාධනය = **D**

නිෂ්පාදන අතිරික්තයේ වැඩිවීම = **B + C** (ලකුණු 2)

(ii) භාණ්ඩ සැපයීම සඳහා අවම මිලක්, සමතුලිත මිලට වඩා ඉහළින් නම් කල විට ආර්ථික අතිරික්තය අඩුවේ.

සැපයුම සඳහා අවම මිලක් සමතුලිතයට ඉහළින් නියම කළ විට නිෂ්පාදකයන්ට ඉන් වාසියක් ඇති වුවද මිල ඉහළ යාම නිසා ඉල්ලුම් ප්‍රමාණය පෙරට වඩා අඩුවේ. එවිට නිෂ්පාදකයන් ඉල්ලුම් ප්‍රමාණයට සරි ලන සැපයුම් ප්‍රමාණයක් පමණක් සැපයීමට යාමේදී, ඌණ නිෂ්පාදනයක් ඇතිවේ. එවිට ආර්ථික අතිරික්තය අඩුවේ.

(ලකුණු 2)



ඉහත ප්‍රස්ථාරයට අනුව ආර්ථික අතිරික්තය **A + B** ප්‍රමාණයකින් අඩුවේ. (ලකුණු 2)

(iii)

(අ) පාරිභෝගිකයා දරන එකක බද්ද = $\frac{1.6}{1.6 - (-0.4)} \times 80$

$= \frac{1.6}{2} \times 80$

$=$ රු. 64

පාරිභෝගික බදු බර = ඒකක බද්ධ × නව සමතුලිත ප්‍රමාණය

$= 64 \times 2400$

= රු. 153600 (ලකුණු 2)

රජයේ බදු ආදායම = ඒකක බද්ධ × නව සමතුලිත ප්‍රමාණය

$= 80 \times 2400$

රු. 192000 (ලකුණු 2)

(අ) අහිමිවන සුභසාධනය = $\frac{\text{ඒකක බද්ධ} \times \text{සමතුලිත ප්‍රමාණයේ අඩුවීම}}{2}$

$= \frac{80 \times 100}{2}$

= රුපියල් 4000 (ලකුණු 2)

iv. 1. කෘෂි භාණ්ඩ සඳහා අනම්‍ය ඉල්ලුමක් ඇතිවීම.

2. කෘෂි භාණ්ඩ සඳහා අනම්‍ය සැපයුමක් ඇතිවීම.

3. කාලගුණික, දේශගුණික තත්ත්වයන් මත සැපයුම වැඩිවීම හෝ සැපයීම අඩුවීම.

4. බෝග වලට වැළඳෙන රෝග.

5. කෘමි වසංගත හා වන සතුන්ගෙන් වන හානිය.

6. කෘෂි භාණ්ඩ කල්පවත්වා ගත නොහැකි නෂ්‍ය භාණ්ඩ ස්වරූපයක් ගැනීම.

7. එවැනි භාණ්ඩ වල තොග රැස්කර ගැනීම දුෂ්කර වීම.

(ඕනෑම කරුණු 3කට ලකුණු 2ක බැගින් ලකුණු 6)

(04)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(i) ස්ථාවර පිරිවැය

- දේපොළ බදු
- රක්ෂණ ගාස්තු
- බලපත්‍ර ගාස්තු
- ප්‍රාග්ධන ලාභ
- කොන්ත්‍රාත් පදනමෙන් බඳවා ගන්නා සේවකයන්ට ගෙවන වැටුප්

(ස්ථාවර පිරිවැයට උදාහරණ වශයෙන් පිළිතුරු ලබා දුන්නද ලකුණු හිමි වේ 2)

ආරෝපිත පිරිවැය

- අහිමිවන වැටුප් ආදායම
- අහිමිවන පොලී ආදායම
- ආර්ථික ක්ෂය වීම්
- ප්‍රාමාණික ලාභ

(උදාහරණ වශයෙන් පිළිතුරු ලබා දුන්නද ලකුණු හිමි වේ 2)

(ii) නැත. කෙටි කාලයේදී නිමැවුම වැඩිවන විට මුළු ස්ථාවර පිරිවැය නොවෙනස්ව පවතින නමුත් සාමාන්‍ය ස්ථාවර පිරිවැය ක්‍රමයෙන් අඩුවේ. (ලකුණු 2)


එයට හේතුව නිමැවුම වැඩි වුවද, අඩු වුවද, මුළු ස්ථාවර පිරිවැයේ වෙනසක් ඇති නොවුව ද, මුළු ස්ථාවර පිරිවැය නිමැවුමෙන් බෙදීමෙන් ලැබෙන සාමාන්‍ය ස්ථාවර පිරිවැය එක් එක් නිමැවුම් ලක්ෂවල දී වෙනස් වේ. එය ස්ථාවරව නොපවතී. එනිසා සාමාන්‍ය ස්ථාවර පිරිවැය වක්‍රය පහළට බැවුම් වේ.

(ලකුණු 2)

(iii) ලාභ උපරිම නිමැවුම් මට්ටම තෝරා ගැනු ලබන්නේ ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වීමේදී ය. එය ඕනෑම ව්‍යාපාර ආයතනයක ලාභ උපරිම සමතුලිත කොන්දේසියයි. (ලකුණු 2)


එහිදී ආන්තික පිරිවැය වැඩිවෙමින් පැවතිය යුතුය. ආන්තික පිරිවැය අඩුවන විට දී ආන්තික අයභාරයට එය සමාන වුවද ලාභ උපරිම නොවේ. (ලකුණු 2)

(iv) (අ) ප්‍රාමාණික ලාභ අවස්ථාවේ දී මුලු අයභාරය මුලු පිරිවැයට සමාන වේ




(ලකුණු 2)

වෙළෙඳපොළ සැපයුම වැඩිවීම නිසා වෙළෙඳපොළ මිල අඩුවීම නිසා පවත්නා පැරුණු මිල අඩු වේ එවිට අලාභ ලැබීමට සිදු වේ



(ලකුණු 4)

(ආ) නැත. පූර්ණ තරගකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය හැඩයක් ගනු ලබයි. සැපයුම කෙටි කාලීනව වැඩි වන විට එය දකුණට විතැන් වුවද පැවරුණු මිල වෙනස් නොවේ.



(ලකුණු 2)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(05)

i. නිමැවුම් ප්‍රවේශයේ දී වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනු ලබන්නේ කාර්මික, කෘෂි කාර්මික හා සේවා යන අංශවල දළ එකතු කළ අගයන්ගේ එකතුවට, නිෂ්පාදිතය මත බදු අඩු කළ සහනාධාර ගැළපීමෙනි.

(ලකුණු 2)

වෙළෙඳපොළ මිලට ගණනය කළ දළ දේශීය නිෂ්පාදිතය මිල මට්ටම් සඳහා ගලපුම් කළ දළ දේශීය නිෂ්පාදිතය මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ලෙස හඳුන්වයි.

මේ සඳහා වඩාත් යෝග්‍ය ක්‍රමය වන්නේ සුදුසු නිල දර්ශක යොදා ගනිමින් පවත්නා වර්ෂයේ නිමැවුමේ වටිනාකම අවධමනය කිරීමෙනි. (ලකුණු 2)

(ස්ථාවර මිලට දළ දේශීය නිෂ්පාදිතය, මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ලෙස ද හඳුන්වයි)

(ii)

(අ) මෙම ආර්ථිකයේ විදේශ ශුද්ධ ද්විතීක ආදායම් නොමැති අතර, එනිසා එරටේ වැයකළ හැකි දළ ජාතික ආදායම, දළ ජාතික ආදායමට සමාන වේ. (ලකුණු 1)

දළ ජාතික ආදායම රුපියල් බිලියන 27 000 (ලකුණු 1)

(ආ) ජාතික ඉතුරුම් = වැයකළ හැකි දළ ජාතික ආදායම = පරිභෝජනය

= 27 000 - (8 000 + 9 000)

= <u>රු. බි. 10 000</u>

විකල්ප

ජාතික ඉතුරුම් = දළ ජාතික ආදායම - පරිභෝජනය

= 27 000 - (8 000 + 9 000)

= <u>රු. බි. 10 000</u> (ලකුණු 2)

(iii) පෞද්ගලික පරිභෝජනය

රාජ්‍ය පරිභෝජනය

දළ ආයෝජනය

ශුද්ධ අපනයන (ලකුණු 4)

iv. ආර්ථිකයක කාන්දුවීම්

ඉතුරුම් (S)

බදු (T)

. ආනයන (M)

ආර්ථිකයක විදීම් සංරචක

දළ ආයෝජනය (I)

රාජ්‍ය පරිභෝජන වියදම (G)

අපනයන (X) (ලකුණු 6)

v ආයෝජන ගුණකය යනු ස්වාධීන වියදමක් ලෙස ආයෝජනයේ ඇතිවන වෙනස්වීමක් නිසා ජාතික ආදායමේ හෙවත් මූර්ත නිෂ්පාදිතයේ ඇතිවන වෙනස (ΔY) අනුපාතයක් ලෙස දැක්වීමයි.

ආයෝජන ගුණකයකින් නිරූපණය වන්නේ ආයෝජනය වෙනස්වීම නිසා මූර්ත නිමැවුම කොපමණ ගුණාකාරයකින් වෙනස් වුවද යන්නයි. ආයෝජන ගුණකය පහත අයුරින් ගණනය කළ හැකිවේ.

$$\text{ආයෝජන ගුණකය} = \frac{\text{මූර්ත නිෂ්පාදිතයේ වෙනස}}{\text{ආයෝජනයේ වෙනස}}$$

$$\boxed{K = \frac{\Delta Y}{\Delta I}}$$

ආර්ථිකයක ගුණකයේ තරම (ප්‍රමාණය) තීරණය වන්නේ එම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැමියාව මතය. එනිසා ආයෝජන ගුණකය පහත අයුරින් ද ප්‍රකාශ කළ හැකිය.

$$\boxed{K = \frac{1}{MPS}} \qquad \left(\frac{1}{1 - MPC} \;/\; \frac{1}{1 - b} \right)$$

(ලකුණු 2)

(06) i. පොදු පිළිගැනීමක් පැවතීම.
කල්පවත්නා සුළු බව
කුඩා කොටස් වලට බෙදිය හැකි බව
පහසුවෙන් රැගෙන යා හැකි බව
වටිනාකම ස්ථාවර තිබීම.
ව්‍යාජ මුදල් නොතිබීම.
සමජාතීය බව
සුළභ හෝ දුලබ නොවීම (ලකුණු 4)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ii)

සමපේක්ෂණ චේතනාව මත මුදල් ඉල්ලුම් කරනුයේ මුදල් වටිනාකමේ සන්නිධියක් ලෙස ඉටු කරන කාර්යය නිසා ය. ලාභ පරමාර්ථයෙන් මුදලට කරන ඉල්ලුම සමපේක්ෂණ චේතනාව නම් වේ. සමපේක්ෂණ චේතනාව පොළී අනුපාතය මත තීරණය වේ. පොළී අනුපාතය වැඩිවන විට සමපේක්ෂණ චේතනාවෙන් ළඟ තබාගන්නා මුදල් ප්‍රමාණය අඩුවන අතර පොළී අනුපාතය අඩුවන විට සමපේක්ෂණ චේතනාවෙන් මුදල් ළඟ තබාගන්නා ප්‍රමාණය වැඩිවේ.

පොළී අනුපාතිකය මුදල් ශේෂ ළඟ තබාගැනීමේ ආවස්ථික පිරිවැය පෙන්නුම් කරයි. පොළී අනුපාතය ඉහළ යන විට, මුදල් ශේෂ ළඟ තබාගන්නා විට අහිමිවන පොළී ආදායම එහි ආවස්ථික පිරිවැය වේ. පොළී අනුපාතය ඉහළ යන විට ළඟ තබාගන්නා මුදල් ශේෂ අඩු වේ.

(ලකුණු 4)

(iii) මුදල් ප්‍රමාණවාදී විග්‍රහයට අනුව මුදලේ සංසරණ ප්‍රවේගය හා ගනුදෙනු ප්‍රමාණය (T) ස්ථාවරව පවතින විට මුදල් සැපයුම හා මිල මට්ටම අතර ඍජු (අනුලෝම) හා සමානුපාතික සම්බන්ධතාවය ඇතිවන බව ප්‍රකාශ වේ.

මෙම න්‍යාය විග්‍රහ කිරීම සඳහා විනිමය සමීකරණයක් ගොඩ නඟා ඇත. එනම් **MV = PY** වේ. සමීකරණයේ **M** යනු මුදල් සැපයුමයි. **P** යනු මිල මට්ටමයි. (ලකුණු 4)

iv.

පාරිභෝගික මිල දර්ශකයෙන් මනිනු ලබන උද්ධමනය ගැලපීමකට හෝ සංශෝධනයකට ලක්ව, මිල දැඩිව උච්චාවචනයන්ට පාත්‍රවන මිල ගණන් බැහැර කරමින් ගණනය කරන උද්ධමන අනුපාතිකයයි.(ලකුණු 1)

ලෝකයේ බොහෝ රටවල මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදකයන් මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ තීරණය ගනු ලබන්නේ, පාරිභෝගික මිල දර්ශකයෙන් තාවකාලික මිල වෙනස්කම් ඉවත් කළ පසු ශේෂ වන උද්ධමනයේ යටිඳුරි ප්‍රවණතාවන් අධ්‍යයනය කරමිනි. (ලකුණු 1)

මෙලෙස උද්ධමනයේ යටිඳුරි ප්‍රවණතා හඳුනාගැනීම සඳහා තාවකාලික වෙනස්කම් බැහැර කරමින් සකසනු ලබන උද්ධමන අනුපාතිකය මූලික උද්ධමනය වශයෙන් හඳුන්වනු ලැබේ. (ලකුණු 1)

මූලික උද්ධමනයේ දී මිල දර්ශකයෙන් නැවුම් ආහාර, ඉන්ධන හා ප්‍රවාහනයේ වියදම්වල මිල ගණන් වෙනස්වීම බැහැර කොට මිල දර්ශකය ගණනය කරනු ලබයි. (ලකුණු 2)

v.

ජාතික පාරිභෝගික මිල දර්ශකය

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (ලකුණු 2)

(07)

(i) මහජනයා සතු ව්‍යවහාර මුදල්

වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්

වාණිජ බැංකු මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතු

රාජ්‍ය නියෝජිත ආයතන මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතු (ලකුණු 4)

(ii)

ශ්‍රී ලංකා මහ බැංකුව මහජනයාට හා වාණිජ බැංකුවලට ඇති සෘජු මූල්‍ය වගකීම් පදනම් මුදල් වන අතර එය රටක මුදල් සැපයුමට පදනම සපයන මුදල් වේ. මහජනයා සතු ව්‍යවහාර මුදල්, වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් හා වාණිජ බැංකු මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන තැන්පතු එයට අයත් වේ.

නමුත් මුදල් සැපයුම යන්නෙන් අදහස් වන්නේ කිසියම් දිනකට මහජනයා සතු මුදල් තොගයේ වටිනාකමයි. එය මහජනයා සතු මුදල් තොග සංකල්පයක් ලෙස ගණනය කරනු ලබයි. පදනම් මුදල් සියල්ල මුදල් සැපයුමේ අන්තර්ගත නොවේ.

(ලකුණු 4)

(iii) (අ) මුදල් ගුණකය = $\frac{\text{මුදල් සැපයුම}}{\text{පදනම් මුදල්}}$ (ලකුණු 1)

= $\frac{5\ 000}{1\ 500 + 350 + 150}$ (ලකුණු 2)

= $\frac{2.5}{}$ (ලකුණු 1)

(ආ) 2.5 = $\frac{\text{මුදල් සැපයුමේ වෙනස}}{40}$ (ලකුණු 1)

මුදල් සැපයුම රුපියල් බිලියන 100කින් වැඩි වේ. (ලකුණු 1)

iv. මහ බැංකුව එක් දින තනි ප්‍රතිපත්ති පොළී අනුපාතය යටතේ නිත්‍ය තැන්පතු පහසුකම් හා නිත්‍ය ණය පහසුකම් සපයනු ලබයි.

නිත්‍ය තැන්පතු පහසුකම් ඇති කරන විට පොළී අනුපාත කොරිඩෝවේ පහළ සීමාව තීරණය වේ. එමඟින් පොළී අනුපාතය පහළ යාම සීමා වේ. නිත්‍ය ණය පහසුකම් ඇති කරන විට පොළී අනුපාත කොරිඩෝවේ ඉහළ සීමාව තීරණය වේ. එමඟින් පොළී අනුපාතය ඉහළ යාමේ ප්‍රවණතාවය සීමා වේ.

එම පොළී අනුපාතය සීමා ඒක්ෂණ මුදල් වෙළෙඳපොලේ පොළී අනුපාතික කොරිඩෝවක් ඇති කරනු ලබයි.

අන්තර් බැංකු ඒක්ෂණ වෙළෙඳපොලේ පොළී අනුපාත වෙනස්වීම් ඉතා ඉක්මනින් අනෙකුත් පොළී අනුපාත කෙරෙහි බලපෑම් ඇති කරනු ලබයි. අන්තර් බැංකු පොළී අනුපාතිකයන්හි විශාල විචල්‍යතාවයක් ඇති වීම වැළැක්වෙන පරිදි මෙම පොළී අනුපාත කොරිඩෝව නියම කරනු ලැබේ. (ලකුණු 4)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(08)

(i)

පොදු භාණ්ඩයක් නම් කිරීම

උදාහරණ - රූපවාහිනී සංඥා

රූපවාහිනි සංඥා පරිභෝජනයේ තරගකාරීත්වයක් නොමැත. එක් අයෙකුගේ පරිභෝජනය නිසා තවත් අයෙකුගේ පරිභෝජනය අහිමි නොවේ. එනම් ආවස්ථික පිරිවැයක් ඇති නොවේ. (ලකුණු 2)

රූපවාහිනී සංඥා පරිභෝජනය සීමා කළ නොහැක. එහි නොමිල භාණ්ඩ ගැටලුවක් පවතී. එනම් ඒවා පරිභෝජනයේදී මිලක් අයකළ නොහැකි නිසා පරිභෝජනය සීමා කළ නොහැක.

(ලකුණු 2)

(ii) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, වගකීම් සහිතව හැසිරවීමට හැකි වීම, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව නොපියවූ විශාල වූ ණය ප්‍රමාණයක් ඇති රටවලට ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් ඇති කරගැනීම වැදගත් වේ. එවිට තව තවත් ණය රැස්නොකොට ණය සේවා පවත්වා ගැනීමේ හැකියාවක් ඇතිවේ

ණය මත රදා පැවැත්ම අඩුවීම ප්‍රාථමික ශේෂය අතිරික්තයක් පවතින විට රජයට ලබාගන්නා ණය ප්‍රමාණය අඩු කරගත හැකි වේ. ප්‍රාථමික ගිණුම් හිඟයක් පවතින විට ඉන් නිරූපණය වන්නේ රජයට තවදුරටත් ණය ලබාගැනීමට සිදුවන බවයි.

ණය බර අඩු කිරීම රාජ්‍ය ණය හා දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය ඉහළ නොයා පවත්වාගැනීමට හෝ පහළ හෙළීමට වැදගත් වේ. මෙයින් අදහස් වන්නේ අතිරේක ණය මත රදා නොසිට වෙනත් සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් වෙන්කල හැකි බවයි

ණය ලැබීමට සුදුසු වීම_අතිරික්ත ප්‍රාථමික ගිණුමේ ශේෂයක් පවතින විට ණය ශ්‍රේණිගත කරණ ආයතන හොඳ ශ්‍රේණිගත කිරීමක් ලබාදෙන අතරම අඩු පොලියක් යටතේ ණය ලබා ගත හැකිවේ

(ලකුණු 4)

(iii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අඩුවීමක් නිරූපණය වේ.

2022 114.2%

2023 104.7%

2024 96.1% (ලකුණු 2)

නමුත් රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමෙන් ණය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාගත නොහැක.

ශ්‍රී ලංකාවේ ණය ධාරිතාවය ක්‍රමයෙන් වැඩි වී ඇත.

වර්ෂය	රාජ්‍ය ණය (රුපියල් ට්‍රිලියන)
2015	8.5
2023	28.6

(ලකුණු 2)

(කුමන හෝ වසර දෙකක සංඛ්‍යා දත්ත දැක්විය යුතුය)

iv. (ආ)

දළ මූල්‍යන අවශ්‍යතාවය = 8 000

ණය ආපසු ගෙවීම් = 3 000

අයවැය හිඟය = 5 000

අයවැය හිඟය = 5 000

රාජ්‍ය අයභාරය = 4 000

මුළු රාජ්‍ය වියදම = 9 000 (රුපියල් බිලියන) (ලකුණු 2)

(ආ) රාජ්‍ය වියදම = $\frac{9\ 000}{100} \times 82$

වර්තන වියදම = රු.බි. 7 380 (ලකුණු 2)

iv පුද්ගල හෝ ව්‍යාපාරික ආදායම මත සෘජුවම අයකරන බදු සෘජු බදු වන අතර රජය බදු අය කළ පසු අදාළ පාර්ශවය විසින්ම බදු ගෙවිය යුතු අතර එවැනි බදු තවත් අයෙකුට විතැන් කළ නොහැකි වේ. සෘජු බදු කිහිපයක් පහත වේ.

පුද්ගල ආදායම් බදු
උපයන විට ගෙවන බදු
සමාගම් බදු
පොළී ආදායම් බදු (ලකුණු 4)

(09)

(අ) භාණ්ඩ වර්ග දෙකේම වාසිය A රටට හිමිවේ. (ලකුණු 2)

(ආ) හැකි නොවේ. රටවල් දෙකේම ආවස්ථික පිරිවැය සමාන වන බැවින් සාපේක්ෂ වාසියක් කිසිදු රටකට හිමි නොවේ. (ලකුණු 2)

(ඉ) සමාන ඵලදායිතාවක් ඇති වන නිසා රටවල් දෙකටම නිරපේක්ෂ වාසියක් හිමි නොවේ. (ලකුණු 2)

දෙරටේ ආවස්ථික පිරිවැය සමාන වන නිසා සාපේක්ෂ වාසියක් ද කිසිදු රටකට හිමි නොවේ. (ලකුණු 2)

(ii) (අ) තීරු බද්දක් මගින් දේශීය භාණ්ඩයේ මිලට වඩා ආනයනික භාණ්ඩයේ මිල ඉහළ යාමට ඉඩ හරිනු ලබන ප්‍රතිශතය මගින් දේශීය නිෂ්පාදකයන්ට ලබාදෙන ආරක්ෂණයයි. (ලකුණු 2)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

(ආ) නිමැවුම 80 000 96 000

ආනයනික යෙදවුම් 30 000 30 000

නිදහස් වෙළෙඳාමේ එකතු කළ අගය 50 000 තීරු බදු යටතේ එකතු කළ අගය 66 000 (ලකුණු 2)

$= \frac{66\,000 - 50\,000}{50\,000} \times 100$

= 32% (ලකුණු 2)

(iii) (අ) විදේශ සේවා නියුක්ති ප්‍රේෂණ

රෙදි පිළි හා ඇඟලුම් අපනයන

සංචාරක ඉපයීම

තේ අපනයන ආදායම (ලකුණු 4)

(ආ) ඇමරිකා එක්සත් ජනපදය

එක්සත් රාජධානිය (ලකුණු 2)

(10)

(i) ප්‍රවාහන සේවා

සංචාර සේවා

සන්නිවේදන සේවා

මූල්‍ය සේවා

රක්ෂණ සේවා

පරිගණක තොරතුරු සේවා

(කුමන හෝ සේවා 5ක් නම් කර තිබීම ලකුණු 5)

(ii) භාණ්ඩ ගිණුමේ ශේෂය සමන්විත වන්නේ වෙළෙඳ භාණ්ඩ අපනයන ආදායමෙන් ආනයන වියදම අඩුකළ පසු ඉතිරි වන ශේෂයයි.

ශුද්ධ අපනයන යනු භාණ්ඩ හා සේවා අපනයන ආදායමත් භාණ්ඩ හා සේවා ආනයන වියදමත් අතර ශේෂයයි. ශුද්ධ අපනයන සඳහා වෙළෙඳ ශේෂය ද යොදා ගනු ලබයි. (ලකුණු 4)

(iii) (අ) ප්‍රාථමික ආදායම් ගිණුම

(ආ) ප්‍රාග්ධන ගිණුම

(ඉ) වෙළෙඳ ගිණුම

(ඊ) ද්විතීක ආදායම් ගිණුම (ලකුණු 4)

(iv) (අ)	බැර	හර	ශේෂය	
වෙළෙඳ භාණ්ඩ	4 000	6 800	- 2 800	(ලකුණු 1)
සේවා	3 000	1 900	1 100	(ලකුණු 1)
ප්‍රාථමික අදායම	2 800	3 200	- 400	(ලකුණු 1)
ද්විතීක ආදායම්	1 800	100	1 700	(ලකුණු 1)
ජංගම ගිණුමේ ශේෂය			- 400 රු.බි	(ලකුණු 1)

(ආ) ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය = 40

ජංගම ගිණුමේ ශේෂය = - 400

ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තය + 440 රු.බි (ලකුණු 2)


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

LOL
Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

25% OFF
ALL BOOKS

**Including Exercise Books,
CR Books, and B5 Books**



ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

Cash On Delivery Available

ORDER A/L TERM TEST PAPERS, SHORT NOTES, WORKBOOKS & REVISION BOOKS

SINHALA, ENGLISH & TAMIL MEDIUM



LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

0717774440 (WHATSAPP)

WWW.LOL.LK